මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

# Trade National Single Window System Project (TNSWSP)

## රැකියා පුරප්පාඩු නිවේදනය - රියදුරු තනතුර (පුරප්පාඩු 01)

**දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජිතායතන වෙත වෙළඳුන් විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵල ද අයදුම්කරුවන් වෙත ස්වයංක්‍රීය වෙළඳ ජාතික තනි කවුළුවක් හරහා දැන්විය යුතු ය.**

**ඒ අනුව, මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීමට සහ වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සඳහා රාජ්‍ය අංශයේ/ පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවක පිරිස අතුරින් රියදුරු තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ.**

### සුදුසුකම්

- ➢ වාර දෙකකට නොවැඩි වාර ගණනක දී, අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම;
- ➢ වලංගු රියදුරු බලපත්‍රයක් සතුවිය යුතු ය; **සහ**
- ➢ රාජ්‍ය අංශයේ/ පෞද්ගලික අංශයේ රියදුරෙකු වශයෙන් අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්ද.

### පොදු කොන්දේසි

- 2025.01.20 වන දිනට වයස අවුරුදු 55ට නොවැඩි විය යුතු ය.
- තෝරාගන්නා අයදුම්කරුවන් මාස 36ක කාල සීමාවක් සඳහා බඳවාගනු ලැබේ. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් ද්විතීයන පදනමින් (Secondment Basis) බඳවාගනු ලබන අතර, පෞද්ගලික අංශයේ අයදුම්කරුවන් වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- 2025.01.20 වන දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතු ය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් සතු ය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නඟින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

### අයදුම්කිරීමේ ක්‍රමවේදය

මෙම දැන්වීමට යා කොට ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්පත් පිළියෙළ කර, එම අයදුම්පත/ ජීව දත්ත පත්‍රිකාව සහ සහතික කරන ලද සහතික පත්‍ර 2025.01.20 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑල ඔස්සේ යොමු කරන ලෙස සියලු අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. රාජ්‍ය අංශයේ/ අර්ධ රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානීන් හරහා යොමුකළ යුතු අතර පෞද්ගලික අංශයේ අයදුම්කරුවන් තමා පිළිබඳ තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන තැනැත්තන් දෙදෙනෙකු (අවසාන වශයෙන් සේවය කළ ස්ථානවල සේවාදායකයන් විය යුතු ය) සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළුව අනෙකුත් ලේඛන සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත අඩංගු කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**ලිපිනය:**
ව්‍යාපෘති අධ්‍යක්ෂ
වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ප්‍රතිපත්ති සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 01.

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර අයදුම්පත සමඟ අදාළ සියලු ලේඛන අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කිරීම තනතුර සඳහා නොසුදුසු වීමට හේතුවක් වනු ඇත.

**ලේකම්**
මුදල්, ප්‍රතිපත්ති සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
දිනය: 2025.01.04

**වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය**

**අයදුම් පත්‍රය - රියදුරු තනතුර**

## A. *පෞද්ගලික තොරතුරු*

**1.** සම්පූර්ණ නම : ……………………………………………………………………..

……………………………………………………………………………………………………..

**2.** මුලකුරු සමඟ නම : ……………………………………………………………………..

**3.** ලිපිනය : ……………………………………………………………………..

**4.** උපන් දිනය : ……………………………………………………………………..

**5.** ජා.හැ. අංකය : ……………………………………………………………………..

**6.** දුරකථන අංකය : ……………………………………………………………………..

**7.** දැනට සේවයේ නියුතු තනතුර :……………………………………………………………..

**8.** දැනට සේවයේ නියුතු ස්ථානය :……………………………………………………………..

## *B. අධ්‍යාපන සුදුසුකම් (ඔබට අවශ්‍ය නම් වෙනම කඩදාසියක් භාවිතා කරන්න)*

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………..

## *C. සේවා පළපුරුද්ද (ඔබට අවශ්‍ය නම් වෙනම කඩදාසියක් භාවිතා කරන්න)*

| අනු අංකය | සේවය කළ ස්ථානය | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

***අයදුම්කරුගේ සහතිකය***

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය බවටත් නිවැරදි බවටත් සහතික කරමි. තවද මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව පත්කරනු ලැබීමට පෙර අනාවරණය වුවහොත් පත්වීම සඳහා නුසුදුස්සෙකු වන බවත්, පත් කරනු ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව තනතුරින් පහකරනු ලැබීමට යටත්වන බවටත් මා විසින් දැනුවත් ය.

.....................................　　　　　　　　.....................................................

**දිනය**　　　　　　　　**අයදුම්කරුගේ අත්සන**

***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය***

මෙම දෙපාර්තමේන්තුවේ .............................................................. තනතුරෙහි සේවයේ නියුතු ......................................................................මහතා/ මහත්මිය/මෙනෙවිය විසින් සපයා ඇති ඉහත තොරතුරුවල සත්‍යතාවය පිරික්සා බැලූ බවත් එකී නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවට අනුව එම තොරතුරු සත්‍ය බවටත් සහතික කරමි. ඔහු/ඇය එම තනතුරෙහි ස්ථිර කර ඇති බවත් ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවටත් සහතික කරන අතර ඔහු/ඇය කිසිදු විනය ක්‍රියාමාර්ගයකට යටත් නොවූ බවත් එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමේ අදහසක් නොමැති බවටත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තේරී පත්වුවහොත් අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව සේවයෙන් මුදා හැරිය හැකි ය (අදාළ නොවන වචන කපා හරින්න).

..............................　　　　　　　　........................................................................

**දිනය**　　　　　　　　**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව**